# මැතිවරණ දින වාර්තාව
# පාර්ලිමේන්තු මැතිවරණය අගෝස්තු 05, 2020

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පවත්වන ලද 8 වන පාර්ලිමේන්තු මැතිවරණය, එහි අවසාන ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් සිදු කළ හැකි ආකාරයේ බරපතල ප්‍රචණ්ඩ සිදුවීම් හෝ මැතිවරණ නීතිය උල්ලංඝනය කිරීමේ සිදුවීම්වලින් තොරව අද (05) දින සාමකාමීව අවසන් විය.

මෙම තත්ත්වය මගින් මැතිවරණ පැවැත්වීමේදී හා මැතිවරණ නීති දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිර්මාණය වී තිබූ ධනාත්මක ප්‍රවණතාවයේ අඛණ්ඩ පැවැත්ම තවදුරටත් තහවුරු වන අතර, ඒ පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවට, දේශපාලන පක්ෂවලට සහ පොලීසිය ඇතුළු ආරක්ෂක අංශවලට පැෆ්රල් සංවිධානයේ ප්‍රසංශාව හිමිවේ.

පැෆ්රල් සංවිධානය විසින් ඡන්ද මධ්‍යස්ථාන තුළ නිරීක්ෂණ කටයුතු සඳහා නිරීක්ෂකයින් 3040 සහ මැතිවරණ දිනයේදී ඡන්ද මධ්‍යස්ථාන තුළ සහ ඒ අවට සිදු කෙරෙන ක්‍රියාකාරකම් නිරීක්ෂණය සඳහා නිරීක්ෂකයින් 1100 දෙනෙකුගෙන් සමන්විත ජංගම රථ 260 ක් යොදවනු ලැබිය. දිගුකාලීන නිරීක්ෂකයින් 319 දෙනෙකුගේ සහාය ඔවුන්ට ලැබුණි. එමෙන්ම, පසුගිය මැතිවරණවල අත්දැකීම් සහ පූර්ව මැතිවරණ කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ඇතැම් සිදුවීම් සැලකිල්ලට ගනිමින්, ගැටුම්කාරී තත්ත්වයන් උද්ගතවිය හැකි තෝරාගත් ස්ථානවල මැතිවරණ කටයුතු නිරීක්ෂණය සඳහා ජාතික මට්ටමින් ජංගම නිරීක්ෂණ කණ්ඩායම් 13 ක් යොදවනු ලැබිය. ඊට අමතරව දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් 25 දෙනෙක්, ක්ෂේත්‍ර සම්බන්ධීකාරකවරුන් 25 දෙනෙක් සහ දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවන ලද පැමිණිලි කළමනාකරණ ඒකක 25ක් භාරව කටයුතු කළ නිරීක්ෂකයින් 25 දෙනෙක් ද මෙම පිරිසට අයත්විය.

කෙසේ වෙතත්, ඡන්දය ආයාචනා කිරීම් , මැතිවරණ දිනය තුළ නීතිවිරෝධී ලෙස ඡන්ද ප්‍රචාරණයේ නියැලීම , ඡන්දදායකයින් ප්‍රවාහනය කිරීම, ඡන්ද මධ්‍යස්ථාන අවට අපේක්ෂකයින්ගේ මුද්‍රිත රූප ඇතුළත් කුඩා පත්‍රිකා විසුරුවා හැරීම, මහියංගන ප්‍රදේශයේදී සිදුකළ පහරදීමක් සහ මහනුවර ප්‍රදේශයේදී ගිනි අවියක් පෙන්වා තර්ජනය කිරීම සහ හොර ඡන්ද දැමීමේ සිදුවීම් 15කට අධික ප්‍රමාණයක් ඇතුළත් සිදුවීම් කිහිපයක් වාර්තා වී තිබේ. ඊට අමතරව, නිකවැරටිය හා අක්කරෙයිපත්තුවේ ප්‍රමුඛ පෙළේ දේශපාලනඥයින් පිරිසක් ඡන්ද මධ්‍යස්ථානය අවට ප්‍රදේශයට වාහන පෙරහැරකින් යාමේ සිද්ධීන් දෙකක් ද වාර්තා වී තිබේ.

මැතිවරණ දිනය අවසානයේදී ප්‍රචණ්ඩ ක්‍රියා 6 ක් සහ නීති විරෝධී මැතිවරණ ප්‍රචාරක සිද්ධීන් 60 ක් සහ ඡන්ද ආයාචනා කිරීම් 33 ක් ඇතුළු මැතිවරණ නීති උල්ලංඝනය කිරීමේ තවත් සිදුවීම් 147 ක් අපට වාර්තාවී තිබේ.වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී තිබෙන්නේ මහනුවර දිස්ත්‍රික්කයෙන් වන අතර කුරුණෑගල සහ කොළඹ දිස්ත්‍රික්කවලින් ඊළගට වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇති දිස්ත්‍රික්කයන් වේ . සමාජ මාධ්‍ය විසින් නිහඬ කාලය තුළ සිදු කරන ලද මැතිවරණ නීති උල්ලංඝනය කිරීමේ සිද්ධීන් 4439 ක් සහ මැතිවරණ දිනයේදී සිදු කරන ලද එවැනි උල්ලංඝනයන් 510 ක් පිළිබඳව ද වාර්තා වී තිබේ.

මෙම මැතිවරණයේ විශේෂත්වය වන්නේ එය කෝවිඩ් -19 වසංගත තර්ජනයක් පවතින පසුබිමක් තුළ පැවැත්වීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මැතිවරණය අවස්ථා දෙකකදී කල් දැමීමට සහ මැතිවරණ පෙළපාලි පැවැත්වීම,ගෙයින් ගෙට ගොස් මැතිවරණ ප්‍රචාරක කටයුතු කිරීම හා මැතිවරණ ප්‍රචාරක කාර්යාලවල ක්‍රියාකාරකම් සීමා කිරීමට සිදුවිය. මෙම පසුබිම තුළ කොවිඩ් -19 සෞඛ්‍ය රෙගුලාසි හේතුවෙන් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා පනවා තිබූ සීමාවන් නිසා අපේක්ෂකයින්ගේ මනාප අංක ප්‍රදර්ශනය කර ගැනීමේ ගැටලුවක් ඇති විය. මෙහිදී වැඩි ආර්ථික හැකියාවක් ඇති අපේක්ෂකයින්ට එවැනි හැකියාවක් නොමැති අපේක්ෂකයින්ට වඩා පුළුල් ලෙස විද්‍යුත්, මුද්‍රිත හා සමාජ මාධ්‍ය යොදාගනිමින් ඔවුන්ගේ ප්‍රචාරක කටයුතු අඛණ්ඩව කරගෙන යාමට සහ මනාප අංකවලට වැඩි ප්‍රසිද්ධියක් ලබාදීමට හැකි විය. එමගින් අසමාන තරග බිමක් නිර්මාණය වූ අතර සියලු අපේක්ෂකයින් සඳහා සම බිමක් සහතික කිරීම පිණිස මැතිවරණ ප්‍රචාරක

වියදම් සීමා කිරීමේ නීති හඳුන්වා දීමේ අවශ්‍යතාව ඉස්මතු කරයි.


මැතිවරණ කොමිසම යම් සාධනීය උත්සාහයක් දැරුවද අනිවාර්ය නිරෝධායනයට භාජනය වී සිටින පුද්ගලයන්ට ඔවුන්ගේ ඡන්ද අයිතිය ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් නොලැබීම මෙම මැතිවරණයේදී ඉස්මතු වූ තවත් ගැටළුවක් වූ අතර එමගින් එවැනි පුද්ගලයන්ට මැතිවරණ දිනයට පූර්වයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව සලසා දීම සඳහා නීති සම්පාදනය කිරීමේ වැදගත්කම අවධාරණය කෙරේ. එවැනි නීති මගින් මැතිවරණ දිනයේ වැඩ කරන සහ විදේශ රටවල පදිංචිව සිටින සහ අත්‍යවශ්‍ය සේවාවන්හි නියුක්තව සිටින පුද්ගලයින් ඇතුළු තවත් කණ්ඩායම් කිහිපයකට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය භුක්ති විඳීමට අවශ්‍ය පහසුකම් සලසා දිය යුතු වේ. මැතිවරණ ප්‍රචාරක වියදම් සිමා කිරීම සහ මැතිවරණ දිනයට පූර්වයෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කර සම්මත කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලෙස පැෆ්රල් සංවිධානය නව පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටී.

ඡන්දදායකයින්ට බියෙන් තොරව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්ද මධ්‍යස්ථානවල සෞඛ්‍ය හා ආරක්ෂිත ප්‍රමිතීන් සහතික කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල නිලධාරීන් මෙන්ම සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහ ආරක්ෂක අංශවල නිලධාරීන් විසින් අවශ්‍ය පහසුකම් සැපයීම සහ ඒ සඳහා ඔවුන් තුළ පැවති වගකීම සහ කැපවීම අපි අගය කරමු. සියලුම ඡන්ද මධ්‍යස්ථානවල සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කිරීම, දුරස්ථභාවය පවත්වා ගැනීම, ඡන්ද මධ්‍යස්ථානවලට ඇතුළු වන විට සහ පිටවීමේදී අත් සේදීම සහ අත්වල සනීපාරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සම්පාදනය කර තිබුණි. ඊට අමතරව මුහුණු ආවරණයක් නොපැළඳ ඡන්දය ප්‍රකාශ කිරීමට පැමිණි අයට මුහුණු ආවරණ ලබා දී තිබුණි.

පෞද්ගලිකව තමන්ට මුහුණ පෑමට සිදුවිය හැකි සෞඛ්‍ය අවධානම පවා නොසලකා, වගකිවයුතු පුරවැසියන් ලෙස තම යුතුකම ඉටුකිරීම පිණිස ඡන්ද මධ්‍යස්ථාන වෙත ගොස් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැඩිහිටියන් සහ දුර්වල සෞඛ්‍ය තත්වයන් ඇති පුද්ගලයින් විසින් පෙන්නුම් කරනු ලැබූ ධෛර්යය පැෆ්රල් සංවිධානයේ විශේෂ ඇගයීමට ලක්වේ.

මෙවැනි පසුබිමක් තුළ සියයට 71 ක පිරිසක් ඡන්දය ප්‍රකාශ කිරීම සතුටුදායක තත්ත්වයක් බව සඳහන් කළ යුතුය. මැතිවරණ නීතිය පිළිපැදීම, මැතිවරණ ක්‍රියාවලිය සාමකාමී හා සතුටුදායක මට්ටමක පවත්වා ගැනීම පිළිබඳව දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයින්ගෙන් බහුතරයකට පැෆ්රල් ආයතනයේ ප්‍රසංශාව හිමිවේ.

ඡන්ද ගණන් කිරීමේ කාලය තුළ ද මෙම යහපත් හැසිරීම එලෙසින්ම පවත්වා ගෙන යන ලෙසත්, පශ්චාත් මැතිවරණ කාලය තුළ මැතිවරණ ප්‍රතිඵල සාමකාමීව සමරන ලෙස අපි සියලු පාර්ශ්වවලින් අප ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.



රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ

**ELECTION DAY REPORT**

**PARLIAMENTRY ELECTION 05th AUGUST 2020**

The 8th Parliamentary Election under the 1978 Constitution concluded peacefully today without any major incident of violence or major violation of election law on Election Day which could have influenced the final result of the election. This is a continuation of a positive trend in the conduct of elections and in the strict implementation of election laws for which the Election Commission, Political Parties and Defense team including The Police need to be commended.

However, there were a few incidents of appealing for votes, illegal campaigning during the Election Day, transportation of voters, scattering of small printed images of candidates around the polling station, an assault in Mahiyangana and an incident of threatening with firearm in Kandy and more than 15 incidents of voter impersonation. There were also two incidents of vehicle procession into the vicinity of polling centres by leading politicians in Nikaweratiya and Akkaraipattu.

At the conclusion of the Election Day, we have received 6 acts of violence, 147 other violations including 60 cases of illegal election propaganda and 33 acts of intimidation of voters.
The highest number of complaints received from Kandy district followed by complaints received from Kurunegala and Colombo districts. There were also 4439 cases of violations of election laws on social media during the cooling off period and 510 such violations on Election Day itself.

PAFFREL deployed 3040 stationary observers and 260 mobile vehicle teams consisting of 1100 observers who monitored the Election Day activities in the polling stations and on the ground.They were supported by 319 long term observers. Taking into account the experience of past elections and the reported ground situation of the pre- election period, 13 teams were deployed at national level for carrying out monitoring in selected hot spot areas. There were also 25 district coordinators and 25 field coordinators and 25 who were engaged in 25 complaint units at the district level.

This Election is significant in that it was conducted in the shadow of the Covid-19 pandemic which resulted in the postponement of the election on two occasions, and restricted election rallies, door to door campaigns and running of the election campaign offices. The strict implementation of the Election Law by the Election Commission limited the number of offices for candidates where they could advertise the preferential number. In this context the restrictions on campaigning due to the Covid -19 health regulations resulted in a problem of

popularizing the preferential number of the candidates. Those who had more resources could continuously use electronic, print and social media for campaigning and popularized their preferential numbers as against those who did not have such resources. This created an unequal playing field and highlights the need for campaign finance laws, which are important to ensure a level playing field for all candidates.

Even though considerable efforts were made by the Election Commission, those undergoing compulsory quarantine could not exercise their right to vote, which emphasizes the importance of drafting laws to provide for advance voting. Such laws will also need to facilitate several other groups to enjoy the right to vote, including those who work and are domiciled abroad and those who are employed in the essential services on the Election Day by providing them with the opportunity to vote in advance. PAFFREL requests the new Parliament to pay special attention to formulate and approve the required laws for campaign finance and advance voting.

PAFFREL appreciates the role played by the Election Commission and District Commissioners and the security forces and health authorities for successfully organizing these elections in an environment complicated by the need to protect the population from the Covid-19 pandemic. We appreciate the preparation, commitment and dedication of the officials of the Election Commission, District Offices of Election and those of the Health Department and Security Forces for ensuring health and safety standards in the polling stations for voters to cast their votes without fear. All polling stations had made arrangements for following the health guidelines, keeping physical distances, providing hand washing facilities and hand sanitization while entering and exiting polling stations. Face masks had been provided for those who came to vote without wearing a face mask.

PAFFREL recognizes the courage shown by the elderly and the people with health conditions going to the polling stations for voting in fulfilment of their duties as citizens without considering the personal health risk to them. The voter turnout of 71 percent was satisfactory in these circumstances.PAFFREL would also like to commend the political parties, independent groups and majority of candidates for adhering to the Election law and maintaining a satisfactory level of integrity. We urge all stake holders to maintain the good conduct during the counting phase and celebrate the results peacefully during the post-election period.

Rohana Hettiarachchie
**Executive Director**